**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
**Ministry of Education, Higher Education and Vocational Education**

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2024 (2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024 (2025)
General Certificate of Education (Ord.Level) Examination, 2024 (2025)

සිංහල භාෂාව හා සාහිත්‍යය **I, II**
சிங்களமொழியும் இலக்கியமும் **I, II**
Sinhala Language and Literature **I, II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න**

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

උපදෙස්:

(i) සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. "මිනිහා **අර අඳින්නේ** අල්ලපු ඉඩමෙත් පොල් වගා කිරීමට යැ"යි සුනිමල් කීවේ ය.
   (1) සොයා බලන්නේ (2) සූදානම් වන්නේ
   (3) කල් බලන්නේ (4) විපරම් කරන්නේ

2. **හතර දිග් බාගෙ** ඇවිද ගියත් ඔහුට එම බෙහෙත් පැළෑටිය සොයා ගත නොහැකි විය.
   (1) සෑම තැනක ම (2) තදාසන්නය
   (3) ප්‍රදේශය පුරා (4) බොහෝ දුරක් ගෙවා

3. සුළු වරදකට පවා **ඇඟට ගොඩ වෙන** මිනිස්සු අද සමාජයේ නිතර හමු වෙති.
   (1) ආරවුල්වල පැටලෙන (2) පහර දෙන්නට තැත් කරන
   (3) දුකට පත් වන (4) උස් හඬින් බැණ වදින

- අංක 4 සිට 6 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න

4. නවක ගායිකාවගේ ගායනය රසිකයන්ගෙන් නොමඳ ................ හිමි වූ බව දක්නට ලැබිණ.
   (1) ආචාරයක් (2) ප්‍රතිචාරයක් (3) උපහාරයක් (4) සම්මානයක්

5. ජයේ රැකියාවක් සඳහා දැරූ උත්සාහය ................ .. වූයෙන් ස්වයං රැකියාවකට යොමු වූ ඔහු ජීවිතය ජය ගත්තේ ය.
   (1) නිරුද්ධ (2) නිරවද්‍ය (3) ව්‍යර්ථ (4) නිස්සාර

6. මහාචාර්ය සේනක බිබිලේ වචනයේ ............. අර්ථයෙන් ම මානව හිතවාදියෙකි.

(1) පරිසමාප්ත (2) සංවිධිත
(3) ප්‍රශස්ත (4) ප්‍රාමාණික

7. සැම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) ප්‍රාසාංගික, නෂ්ටාවශිෂ්ට, ධ්‍රැවාසන්න, ආශ්වාදය
(2) ලාංචනය, රියදුරා, විශ්වාසනීය, මාධූර්යය
(3) අක්‍රිය, උත්සහය, ගැටළු, ඇඟලුම්
(4) කාර්යාලයීය, පරිශුද්ධ, ගනදුර, ඖදාර්ය

8. පළමු අකුරෙහි පිලි **නොයෙදුණු** වචන ඇතුළත් වරණය තෝරන්න.

(1) කෘත්‍රිම, නෞකාව, බාලිකා, වෛද්‍ය
(2) ඖෂධ, ආකෘතිය, ඓතිහාසික, ඍෂිවරු
(3) සෞන්දර්ය, සාහිත්‍යය, විද්‍යාව, භූගර්භ
(4) වෛවර්ණ , දේපළ, වාර්ෂික, ගෞරවය

9. **අමූර්ත** යන පදයෙහි අන්තර්ගත අක්ෂර වර්ග වනුයේ,

(1) කණ්ඨජ, ඕෂ්ඨජ, මූර්ධජ හා දන්තජ ය.
(2) මූර්ධජ, දන්තජ, කණ්ඨජ හා තාලුජ ය.
(3) ඕෂ්ඨජ, කණ්ඨජ, දන්තජ හා මූර්ධජ ය.
(4) මූර්ධජ, තාලුජ, ඕෂ්ඨජ හා කණ්ඨජ ය.

10. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) රන්ටැඹේ, පොල්ගොල්ල, වික්ටෝරියා, උල්හිටිය
(2) හැඩවක, මිල්ල, බුරුත, මැහෝගනී
(3) කැලණි, නිල්වලා, මහවැලි, වලවේ
(4) කවුඩුල්ල, කන්තලේ, මින්නේරිය, ඉරණමඩු

11. ගෞරවාර්ථ උක්ත පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) වෘක්ෂයෝ, පියුම්හු, භික්ෂූහු, වැද්දෝ
(2) මහල්ලෝ, ඇතැම්හු, ව්‍යාපාරිකයෝ, ලේඛිකාවෝ
(3) අමරදේවයෝ, දුවණියෝ, මුත්තණුවෝ, බුදුහු
(4) ශූරයෝ, ඇත්හු, සමහරු, වලස්සු

12. දී ඇති වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත වචනයෙහි විභක්තිය ඇතුළත් වරණය තෝරන්න.
නව **දැනුමෙන්** දිනෙන් දින ලොව අලුත් වෙයි.

(1) කර්ම (2) කරණ (3) අවධි (4) ආධාර

13. **බරනෙත්** යන්න අයත් වනුයේ,

(1) විභක්ති සමාසයට ය.
(2) විශේෂණ සමාසයට ය.
(3) දකාරාර්ථ සමාසයට ය.
(4) අන්‍යාර්ථ සමාසයට ය.

14. **'ත්‍රිමාස + ඉක යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

(1) තෛමාසික (2) ත්‍රයිමාසික
(3) ත්‍රෛයිමාසික (4) ත්‍රිමාසික

15. **මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.**

(1) කෘදන්ත - ගැටුම්, කැවුම්, ලියුම්, ඇඳුම්
(2) සර්වනාම - හෙතෙම,මොහු, මම, ඇ
(3) උපසර්ග සහිත පද - සුලබ, සුරිඳු, සුගම, සුදන
(4) ආගම සන්ධි - දෙවුර, වියැට, කඩයිම්, පුනරුත්

16. සිහිති පුතු **වැටී වැටී** ඇවිදින අයුරු මව ආදරයෙන් බලා සිටියා ය. මෙහි තද කළු අකුරෙන් මුද්‍රිත ක්‍රියා පදය අයත් ක්‍රියා වර්ගය ඇතුළත් වරණය තෝරන්න.

(1) පූර්ව ක්‍රියා (2) අසම්භාව්‍ය ක්‍රියා
(3) විධි ක්‍රියා (4) මිශ්‍ර ක්‍රියා

- අංක 17 – 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. මානවයා හා පරිසරය අතර පවතින්නේ **අවියෝජනීය** සම්බන්ධතාවකි.

(1) නොයෙදිය හැකි (2) වෙන් කළ නොහැකි
(3) වෙනස් නොකළ හැකි (4) වියෝ නොවුණු

18. සෑම ශ්‍රී ලාංකිකයකු තුළ ම මාතෘභූමිය පිළිබඳ **ගර්වයක්** තිබිය යුතු ය.

(1) අභිමානයක් (2) භක්තියක්
(3) ආදරයක් (4) ගෞරවයක්

19. එම සුන්දර වනෝද්‍යානය **විලිකුන්** සුවඳ මලින් ද පලතුරෙන් ද සැදුම් ලද්දේ ය.

(1) මිහිරි (2) නරක් වූ
(3) මේරූ (4) ඉදුණු

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්ය සමග බැඳී **නොපවත්නා** වචනයක් ද සහිත වරණය තෝරන්න.

(1) අහස, තාරකා, වලාකුළු, සඳ
(2) සෙවිලිතහඩු, පරාල, ඇණ, වඩිම්බු
(3) බෝට්ටුව, දැල, යොත, කරත්තය
(4) මවුසය, කොම්පියුටරය, සෝදුපත, අත්පිටපත

21. එක් එක් පද පේළියෙහි දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | පාදප - පියවර, | අංගණ- මිදුල, | වාලුකා - වැලි, | මෝක්ෂ - නිවන් |
| (2) | අසිපත - ඛඩ්ග, | පහන - ශෛල, | විහඟ - සකුණ, | මාගම - ස්ත්‍රිය |
| (3) | නෙලුම්- පියුම්, | ශක්ති - සවි, | ප්‍රගල්භ - දක්ෂ, | අනිල - සුළඟ |
| (4) | පීඨය - පුටුව, | පෘථිවි - දෙරණ, | වක්ත්‍ර - සිරුර, | සත්‍ය - සස් |

22. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) චන්ද්‍රයා - සිසි, සඳ, තරුපති, නිශාකර
(2) මව - ජනනී, මාතෘ, දිනිති,මෑණි
(3) මාළුවා - මත්ස්‍ය, දියදිනි, මීන , මසු
(4) බබළන - දිදුලන, උජ්වලිත, වොරඳනා, විකසිත

23. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

(1) ප්‍රකාශන - විකාශන
(2) ප්‍රත්‍යක්ෂ - අනුමාන
(3) මිලාන - පුෂ්පිත
(4) සංකෝචනය - ප්‍රසාරණය

24. **නිවැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) වාක්‍යයේ උක්තය කර්තෘ විභක්තියෙන් තැබෙයි.
(2) නාමයකට ප්‍රත්‍යය එක්වීමෙන් සෑදෙන්නේ කෘදන්ත නාමයි.
(3) අව්‍යය පද වාක්‍යයක මුල, මැද, අග යන සෑම තැන ම යෙදෙයි.
(4) ප්‍රකෘතියට ප්‍රත්‍යය එක් වීමෙන් සෑදෙන්නේ නිත්‍ය සන්ධි ය.

25. පහත දැක්වෙන වාක්‍යය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍ය තෝරන්න.

(1) ශාන්තිකර සාගරයේ කඩා පැන නැවියන් තෙල් නැවට මුහුදු කොල්ලකරුවෝ බිය ගැන්වූහ.
(2) ගුරුවරුන් සමඟ ක්ෂේත්‍ර චාරිකාවක නියැළුණු සිසු දරුවෝ ගිමන් නිවා ගැනීමට තුරු සෙවණක රැඳුණෝ ය.
(3) ත්‍යාග ප්‍රදානෝත්සවයට පැමිණියේ ආරාධිතයා කතාව සාර්ථක ව කොට සමු ගත්තේ ය.
(4) පාරිභෝගික සේවා අධිකාරියේ නිලධාරීහු මුදලාලිගේ වැඩි මිලට විකුණන සහල් විමසා පරීක්ෂා කොට බැලූහ.

- අංක **26 – 27** ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ ඇතුළත් වරණය තෝරන්න.

26. ප්‍රයෝජනයට ගත නොහැකි දෙයක් ලබා දීම

(1) ආඳා යවා තබාලා වල්පත ගත්තා සේ
(2) නරියාට කුකුළු කොටුව බාර දුන්නා වගේ
(3) පුංචි අම්මාත් ඇවිත් කැවුම් පුංචි කළා වගේ
(4) බල්ලන්ට ලෙලි පොල් දුන්නා වගේ

27. ස්ථිර තීරණයකට බැස ගත නොහැකි ව සිටීම

(1) කතාව දෝලාවෙන් ගමන පයින්
(2) කළුවා මාරපන් ගියා වගේ
(3) එළිපත්ත උඩ ඉන්න බළලා වගේ
(4) වක්කඩේ හකුරු හැංගුවා වගේ

28. ස්වර සන්ධිය, පූර්වරූප සන්ධිය හා ගාත්‍රාදේශ සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) මුලිනුපුටා, සන්නස්, ගිනියම්
(2) ගිනියම්, මුලිනුපුටා, සන්නස්
(3) සන්නස්, ගිනියම්, මුලිනුපුටා
(4) ගිනියම්, සන්නස්, මුලිනුපුටා

- අංක 29-30 යටතේ දක්වා ඇති එක් එක් ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

29. (1) මම මෙන් ඔබ ද සතුන්ට හිංසා නොකළ යුතු ය.
    (2) නරඹන්නෝ ඔල්වරසන් දෙද්දී ක්‍රීඩකයෝ තරගය ජයග්‍රහණය කළහ.
    (3) සුචරිත ගම්ලත්හු විශිෂ්ට සාහිත්‍ය විචාරකයකු වූහ.
    (4) ඇතැම් කාන්තාවන් තමන්ට සිදු වන අසාධාරණය ගැන නිහඬ ව සිටින්නේ ඇයි?

30. (1) සභාපතිවරයා හෙවත් ලේකම්වරිය වාර්තාව සභාගත කළා ය.
    (2) කුඩා සාමණේර හිමි උදැසනින් අවදි වී බෝ මළුව අමදියි.
    (3) වන්දනාකරුවෝ සිරිපා වන්දනාවට පැමිණ ඇත.
    (4) අප පාසලේ ශිෂ්‍යාවෝ මෙවර ජාතික දැල් පන්දු ශූරතාව දිනා ගනිවී.

31. * තරගකරුවන් ........................ තරග ආරම්භක ස්ථානයට වාර්තා කළ යුතු බව සංවිධායකයෝ දැන්වූහ.
    * දෙමාපියන් ......................... දරුවන්ට සුව සලසන්නෝ කවරහු ද?
    * ශිෂ්‍ය ශිෂ්‍යායෝ පාසල ඇරී නිවෙස් ................ ළඟා වෙති.
    * දානපතියා රෝගීන්ගේ පහසුව ................ නවීන වාට්ටු සංකීර්ණයක් ඉදි කළේ ය.

    ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
    (1) වහා, කරා, පිණිස, විනා
    (2) වහා, විනා, කරා, පිණිස
    (3) පිණිස, වහා, විනා, කරා
    (4) වහා, පිණිස, කරා, විනා

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
    "අපි ඔක්කොම නීතියට ගරු කරන්න පුරුදු වෙන්න ඕනෑ"
    (1) අප සියල්ලන් ම නීතියට ගරු කිරීමට පුරුදු විය යුතු ය.
    (2) අප සියල්ලෝ ම නීතියට ගරු කරන්න පුරුදු වීම අවශ්‍ය වෙයි.
    (3) අපි සේරම නීතියට ගරු කිරීමේ පුරුද්ද ඇති කර ගත යුතු ය.
    (4) අපි හැමෝම නීතිගරුක ව ඉන්න වග බලා ගත යුතු ය.

33. "එකල්හි බුද්හු ඉදුහ බලයෙන් ඔවුන් **පිළිබඹා** සඟුන් අතුරෙහි සිටු වූහ." මෙහි පිළිබඹා යන්නෙහි අරුත වන්නේ,

| | |
|---|---|
| (1) පසුපසට කොට | (2) ප්‍රමාද කොට |
| (3) වළක්වා | (4) බාධා කොට |

34. පහත සඳහන් කවියේ දෙවන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

    මැනලා වී දෙකක් නොලැබී          මල්ලකට
    ………………………………………………...…….
    අම්මා ඇවිල්ලා හීනෙන්          දොරකඩට
    ඇහුවා මගෙ පුතේ කිරි ඕනෑද          උඹට

    (1) නන්නාඳුනන මෙනුවර තනි වුණ          අපට
    (2) යම්දෝ හෙට උදේ අපි ආපසු          ගමට
    (3) ඉන්නේ කවුද රැකවරණට          බැල්මකට
    (4) දරුවොත් එක්ක මම වැටිලා ඉන්න          කොට

35. කතා බහෙන් සිනාසෙමින්
**ජීවිතයේ ගිරි දුර්ගය**
නගින
සොඳුරු ගැහැනිය ඔබ

මෙහි තද කළු අකුරෙන් මුද්‍රිත යෙදුම

(1) රූපකයකි (2) උපමාවකි (3) අනුප්‍රාසයකි (4) උත්ප්‍රාසයකි

36. "උපකාරයට පැමිණි අසල්වැසි ආප්ත ගැහැනු කිහිප දෙනෙක් යුහුසුලු වෙති" යන වාක්‍යයෙ **ආප්ත** යන්නෙහි අදහස

(1) නෑණවත් (2) කඩිස (3) තරුණ (4) වැඩිහිටි

37. දිගාමඩුලු උපභාෂාවේ **'බෝල්ලු'** යන්නෙන් අදහස් කරන්නේ,

(1) වියල් ඔරු ය. (2) මී හරක් ය. (3) හම්බාවෝ ය. (4) වලස්සු ය.

38. සිරිගුනසිංහ, ඇරැව්වල නන්දිමිත්‍ර, ආරියවංශ රණවීර, මහගමසේකර යන කතුවරුන්ගේ කෘති පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න

(1) සුදු කොඩි, රන් රෝස, බෝඩිම, හෙවණැල්ල
(2) හෙවණැල්ල, සුදු කොඩි, රන් රෝස, බෝඩිම
(3) හෙවණැල්ල, සුදු කොඩි, බෝඩිම, රන් රෝස
(4) ‌ ‌න් රෝස, බෝඩිම, සුදු කොඩි, හෙවණැල්ල

39. **වතුර මල** කෙටි කතාවේ ඇතුළත් චරිතයකි

(1) යසෝමා (2) මහේන්ද්‍ර (3) සේතු (4) අබිලින්

40. පහත සඳහන් වාක්‍යයේ අදහසට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න

"කවියකු හැටියට ශේක්ස්පියර්ගේ පතළ කීර්තිය ඔහුගේ විවිධ කාව්‍ය නිර්මාණවලින් සහ තුදුස්පද සැහැලිවලින් පළවන නමුදු, එකී අපූර්ව කවිත්වය වඩාත් ම ඔප් නැංවී ප්‍රකාශයට පත් වන්නේ, ඔහුගේ නාට්‍යවල නිර්මාණයන්හි අන්තර්ගත පද්‍යමය නිර්මාණවලිනි"

(1) ශේක්ස්පියර් කවියකු ලෙස ඔහු ලියූ කාව්‍ය නිර්මාණවලින් හා තුදුස් පද සැහැලිවලින් කීර්තියට පත් වුව ද ඔහුගේ අපූර්ව කවිත්වය ප්‍රකාශ වන්නේ නාට්‍ය නිර්මාණගත පද්‍ය මගිනි

(2) ශේක්ස්පියර්ගේ අපූර්ව කවිත්වය ඔහුගේ කාව්‍ය නිර්මාණවලින් ඔප් නැංවුව ද ඔහු කවියකු ලෙස කීර්තියට පත් වන්නේ ස්වකීය නාට්‍ය නිර්මාණයන්හි අන්තර්ගත පද්‍යමය නිර්මාණවලිනි

(3) තුදුස් පද සැහැලිවලින් ශේක්ස්පියර් කවියකු ලෙස ප්‍රකට වුවත් ඔහුගේ කවිත්වය වඩාත් ම ඔප් නැංවී ප්‍රකාශයට පත් වන්නේ කාව්‍ය නිර්මාණවලිනි.

(4) කවියකු ලෙස ශේක්ස්පියර්ගේ පතළ කීර්තිය ඔහුගේ විවිධ කාව්‍ය නිර්මාණවලින් ප්‍රක වන නමුදු, ඔහුගේ අපූර්ව කවිත්වය වඩාත් ඔප් නැංවී ප්‍රකාශ වන්නේ තුදුස් පද සැහැලිවලින් හා නාට්‍ය නිර්මාණයන්ගෙනි

***


iruonline.com

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2024 (2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024 (2025)
General Certificate of Education (Ord.Level) Examination, 2024(2025)

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature, I, II

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

- ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "පරමාදර්ශය" යන වචනයෙහි අන්තර්ගත පහත සඳහන් වර්ගයන්ට අයත් අක්ෂර දෙක බැගින් ලියන්න.

(අ) ඕෂ්ඨජ - ..................... (ආ) තාලුජ - .....................

(ii) පහත දැක්වෙන පද අයත් සන්ධි වර්ගය නම් කරන්න.

(අ) සඳයුරු - .............. (ආ) සිවුරඟ - ................

(iii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් කෘදන්ත පද දෙකක් උපුටා දක්වන්න.

විෂ දුමාරය පැතිරීම හේතුවෙන් විවිධ රෝග වැලඳුණු රෝගීහු කීපදෙනෙක් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගත්හ.

(අ) ....................... (ආ) .......................

(iv) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

සිය පුතුගේ විභාග ප්‍රතිඵල ලේඛණයෙහි සිංහල හා ගණිතය විෂයයන්ට විශිෂ්ට සාමාර්ථ ලැබී තිබුණු බව දැක මව අතිශයින් සන්තුෂ්ටියට පත්වූවා ය.

(අ) ....................... (ආ) .......................

(v) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් අව්‍යය හා ද්කාරාර්ථ සමාසවලට අයත් වචන දෙක පමණක් උපුටා දක්වන්න.

තමන් වෙත පැවරුණු කාර්යය අතපසු කිරීම ගැන නිදහසට කරුණු ඉදිරිපත් කිරීම අනවශ්‍ය බව ආයතන ප්‍රධානියා සේවකසේවිකාවන් හමුවේ කියා සිටියේ ය.

(අ) අව්‍යය සමාසය ............... (ආ) ද්කාරාර්ථ සමාසය ..................

(vi) පහත දැක්වෙන සදොස් වාක්‍ය නිදොස් කොට ලියන්න.

(අ) තම දරුවෝ නොවරදවා ම තමන් බලන්නට ගමට එති 'යි දෙමාපියෝ අපේක්ෂා කරති.

(ආ) කාව්‍යශේඛරය ලියුවේ තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියෝ ය.

(vii) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනිපදය බැගින් ලියන්න.

(අ) තම රටෙන් බැහැර ව වාසය කිරීම (ආ) පරාජයට පත් කළ නොහැකි

(viii) පහත දැක්වෙන වාක්‍යයෙහි තද කළු අකුරෙන් දක්වා ඇති පද අයත් වන ක්‍රියාපද වර්ගය ලියා දක්වන්න.

කරළිය මතට පැමිණි ගී **ගය ගයා** රඟන දරුවන් දෙස **බලග.**

(අ) ........................ (ආ) ...................................

(ix) පහත සඳහන් යෙදුම්වල පළමුවන පදය සමග දෙවැනි පදයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු පදය හෝ දෙවැනි පදය සකස් කර ලියන්න.

(අ) පිරිත් දේශනය (ආ) ශුභ පැතුම්

(x) පහත සඳහන් වාක්‍ය කර්තෘ කාරයට හරවා ලියන්න.

(අ) අංශ ප්‍රධාන ගුරුතුමිය විසින් ශිෂ්‍ය නායිකාවන් ලවා උදෑසන රැස්වීම සංවිධානය කරවනු ලබයි.

(ආ) ඇත්ගොව්වන් විසින් කලබලකාරී ව හැසිරුණු ඇත්තු දෙදෙනෙක් මහත් ආයාසයෙන් පෙරහැරෙන් ඉවතට ගන්නා ලදහ .

(ලකුණු 02 ×10=20යි)

2. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250**කට **නො අඩු** වන සේ රචනයක් ලියන්න.

(ආ)

වර්තමානයේ ශ්‍රී ලංකාවේ වෙළඳපොළෙහි ඇති වී ඇති සහල් හිඟය, ජන ජීවිතය කෙරෙහි ප්‍රබල වශයෙන් බලපා ඇත. මෙවැනි සහල් හිඟයක් ඇති වීම කෙරෙහි දේශගුණ විපර්යාස පමණක් නොව සමාජ, ආර්ථික ගැටලු රැසක් බලපා ඇති බව පෙනෙයි. සහනාධාර ලබා දීමෙන් පමණක් සෑහීමට පත් නොවී නවීන තාක්ෂණික ක්‍රමෝපාය භාවිතයෙන් ද වී වගාවේ අස්වනු නැංවීමට කටයුතු යෙදිය යුතු ව ඇත. එසේ ම සහල් වෙළෙඳ ඒකාධිකාරිය ජය ගැනීම සඳහා රජයේ මෙන් ම වී ගොවීන්ගේ සහයෝගය ද අත්‍යවශ්‍ය වේ.

(ආ)

රටක සංවර්ධනය සඳහා පොදු ප්‍රවාහන පද්ධතිය ශක්තිමත් කළ යුතු බවට සංවර්ධිත රටවලින් ලබා ගත හැකි පූර්වාදර්ශ රැසකි. එසේ වුවත් වර්තමාන ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන ක්ෂේත්‍රය ගැටලුවලින් ගහණ ය. එම ගැටලු නිසා පොදු ප්‍රවාහන සේවාවල සහාය ලබා ගන්නා මගීන්ගේ ජීවිත අවදානම පවා ඉහළ ගොස් තිබීම ඛේදනීය තත්ත්වයකි. මගියා මුල් කරගත් විධිමත් පොදු ප්‍රවාහන සේවයක් වෙනුවෙන් ක්‍රියාත්මක වී පෙරට ඒම, සියලු ජනතාවගේ වගකීමක් බව අවබෝධ කර ගැනීමට සුදුසු කාලය දැන් එළඹ ඇත.

(ඉ)

බෝ නොවන රෝග දිනෙන් දින ශීඝ්‍රයෙන් ඉහළ යාම විවිධ සෞඛ්‍ය ගැටලු පමණක් නොව සමාජාර්ථික ගැටලු සඳහා ද හේතු සාධක වී තිබේ. අහිතකර ආහාර පුරුදු, අව්වේකී බව හා මානසික ආතතිය වැඩිවීම ආදිය මෙම ගැටලුව උත්සන්න කර තිබේ. මේ සඳහා විසඳුම් සෙවීමේ දී අපේ අතීත සාම්ප්‍රදායික ජීවන රටාවෙන් ලබා ගත හැකි අගනා දෑ බොහෝ ය. එසේ ම පාසල් සිසුන් මෙම රෝගවලින් මුදවා ගැනීම සඳහා අධ්‍යාපන ආයතන මගින් සුවිශේෂ දායකත්වයක් ලබා දිය යුතු ය.

(ඊ)

සාහිත්‍ය පරිශීලනයෙන් ලැබෙන ප්‍රයෝජන අතර සහකම්පනය පිළිබඳ සංවේදීතාව වර්ධනය වීම ද සුවිශේෂ වේ. එහි දී සාහිත්‍ය නිර්මාණවල දී හමුවන විවිධ චරිත ඇසුරෙන් ඔවුන්ගේ හැඟීම්, අද්දැකීම් හා ගැටලු අවබෝධ කර ගැනීමට අවස්ථාව හිමි වේ. එමෙන් ම සමාජ අවබෝධය පෘථුල වීම, සමාජ චිත්තවේග සංවර්ධනය, විචාරාත්මක චින්තනය දියුණු වීම, සංස්කෘතික අවබෝධය තියුණු වීම ආදිය ද ඒ හා සමග ම සිදු වේ. ඒ සියල්ල අපට අනෙකාගේ දුක් වේදනා හා සතුට හඳුනා ගැනීමට ආලෝකයක් වන්නේ ය. එබැවින් සාහිත්‍ය පරිශීලනය විෂයෙහි දක්වන අවධානය හා ඒ සඳහා දිරි දීම ද ඉතා ඵලදායී කර්තව්‍යයක් වන්නේ ය.

(ලකුණු 25)

3. පහත සඳහන් පාඨය වචන **60-70** වන සේ **සාරාංශ** කොට ලියන්න. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව පිළිතුර අග සඳහන් කරන්න.

ඓතිහාසික සිද්ධිවල කාලයත් එම සිද්ධි විස්තර කරන සාහිත්‍ය මූලාශ්‍රය රචනා වූ කාලයත් අතර බොහෝ විට පරතරයක් තිබෙන නමුත් පුරාවිද්‍යා මූලාශ්‍රය අදාළ සිද්ධි හා සමකාලීන වන බැවින් එම මූලාශ්‍රය වඩා විශ්වසනීයත්වයකින් සැලකේ. සාහිත්‍ය මූලාශ්‍රයවලට වඩා පුරාවිද්‍යා මූලාශ්‍රයවල විශ්වසනීයත්වය පෙන්නුම් කරන තවත් සාධකයක් නම් සාහිත්‍ය මූලාශ්‍රය බොහෝ විට සුළු සිද්ධි වටා ගෙතුණු ප්‍රබන්ධ වීමත් පුරාවිද්‍යා මූලාශ්‍රය යම් කිසි සිද්ධියක් බොහෝ දුරට ඒ ආකාරයෙන් ම ඉදිරිපත් කරනු ලබන වාර්තා වීමත් ය. මේ සාහිත්‍ය මූලාශ්‍රය රචනා කිරීමේ දී එම ග්‍රන්ථ කර්තෘවරුන්ගේ රුචි අරුචිකම් හා ඔවුන් වාසය කළ වටාපිටාව වැනි කරුණු එම ප්‍රබන්ධවලට බලපා ඇත. එවැනි හේතු නිසා ඒවායේ අන්තර්ගත ඓතිහාසික බීජය වටා නොයෙක් කරුණු ගෙතී ඇති බැව් පැහැදිලි වේ. පුරාවිද්‍යා මූලාශ්‍රයවල මේ අඩුපාඩුකම් දක්නට ලැබෙන්නේ නැති තරම් ය.

පොදුවේ සලකන විට දිවයිනේ ඉතිහාසය අඛණ්ඩ ව ලිවීම සඳහා උපයෝගී කර ගත හැකි වන්නේ සාහිත්‍ය මූලාශ්‍රය ය. මෙම අවිච්ඡින්න ඉතිහාසය ගොඩනැගීම සඳහා පුරාවිද්‍යා මූලාශ්‍රය ක්‍රම කිහිපයකින් උපකාරී වෙයි. පළමුවෙන් ම සාහිත්‍ය මූලාශ්‍රයවල අන්තර්ගත ඇතැම් කරුණුවල සත්‍යතාව නිශ්චය කර ගැනීමට පුරාවිද්‍යා මූලාශ්‍රය මහෝපකාරී වෙයි. දෙවනුව සාහිත්‍ය මූලාශ්‍රයවල සදොස් තැන් නිදොස් කර ගැනීමට ඒවා පිටිවහල් වේ. තෙවනු ව සාහිත්‍ය මූලාශ්‍රයවල අන්තර්ගත නොවන කරුණු පුරාවිද්‍යා මූලාශ්‍රයවලින් ලබා ගත හැකි හෙයින් සාහිත්‍ය මූලාශ්‍රයවලට ඌනපූරක වශයෙන් පුරාවිද්‍යා මූලාශ්‍රය උපයෝගී කර ගත හැකි වේ.

(ලකුණු 10 )

4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

යොවුන් වියේ දරුවන් වෙනුවෙන් සාහිත්‍යකරණයෙහි නිරත වීම සරල කාර්යයක් නොවේ. එය සංකීර්ණ වූ නිර්මාණාත්මක ප්‍රයත්නයකි. වයස අවුරුදු 12 සිට 18 දක්වා වයස් සීමාවේ පසුවන යොවුන් පිරිසකගේ ලෝකයට ආමන්ත්‍රණය කළ යුත්තේ වඩාත් පරිස්සමෙනි. යොවුන් විය යනු සංක්‍රමණික අවධියක් ද වන බැවින් යොවුන් පාඨකයන්ට ලිවීමේ දී යෞවනයාගේ කායික සංවර්ධනය, බුද්ධිමය සංවර්ධනය, චිත්තවේගී සංවර්ධනය, සදාචාර සංවර්ධනය ආදිය පිළිබඳ පෘථුල අවබෝධයක් ලබා ගැනීම අනිවාර්ය කරුණකි. ඒ වෙනුවෙන් රචනා වී ඇති පර්යේෂණ සාහිත්‍යය හැදෑරීම ද නිර්මාණකරුවන්ගේ වගකීමකි. එසේ ම දෙස් විදෙස් යොවුන් සාහිත්‍ය නිර්මාණ ද මනාව ඇසුරු කොට තිබීම කලාත්මක යොවුන් සාහිත්‍යයේ අභිවර්ධනයට රුකුලක් වේ.

යොවුන් වියේ චිත්තවේග පිළිබඳ මනා අවබෝධයකින් යුතු ව ඒවායේ යථා ස්වභාවය පිළිබඳ යොවුන් දරුවාට අවබෝධ කර දීමට හා ඊර්ෂ්‍යාව, උඩඟුකම, හීනමානය ආදි අහිතකර චිත්තවේග පාලනය සඳහා ද නිර්මාණශීලී ලෙස මැදිහත් වීමට හැකි වීම යොවුන් සාහිත්‍යවේදීන්ට ලැබී ඇති අනගි වරප්‍රසාදයකි . නිවැරදි මාර්ගෝපදේශ නොලැබීම නිසා අනේක ව්‍යසන කරා නතු වන යොවුන් දරුවන්, ඉන් මුදවාලීමට යොවුන් සාහිත්‍යය ද උපයෝගී කරගත හැකි ය. එය ඉදිරිපත් කළ යුත්තේ නිර්මාණාත්මක ප්‍රවේශයෙන් මිස හුදු උපදේශ වට්ටෝරු ආදිය ගොනු පිටින් සාහිත්‍ය නිර්මාණ වෙත බහාලීමෙන් නොවේ. කියවීමේ පුරුද්ද වර්ධනය, සමාජ සංවේදීතාව ඇති කිරීම , නායකත්ව කුසලතා වර්ධනය, සන්නිවේදන හැකියා වැඩිදියුණු කිරීම ආදිය ප්‍රවර්ධනයෙහි දී ද යොවුන් සාහිත්‍යය අමතක කළ නොහැකි ය.

යොවුන් සාහිත්‍යයේ ප්‍රභේද කිහිපයක් හඳුනාගත හැකි ය. ඒවා ඓතිහාසික කතා, මායා කතා, මිථ්‍යා කතා, අභිරහස් කතා, වීර කතා, විත්ති කතා ආදි ලෙස විවිධ වේ. යොවුන් සාහිත්‍ය නිර්මාණ, නවකතාව ආදි සාහිත්‍ය ප්‍රවර්ග සමග ද සමීප සබඳතාවක් ප්‍රකට කරන බැවින් එකී ප්‍රවර්ගයන්හි කලාත්මක ලක්ෂණ මෙම යොවුන් සාහිත්‍ය නිර්මාණ හා මුසු වී තිබේ. තව ද මෙම සාහිත්‍ය ප්‍රවර්ගය නිරන්තරයෙන් වර්ධනය වන්නක් වන අතර, නව තාක්ෂණික සහ සමාජීය වෙනස්කම් සමග අනුවර්තනය වෙමින් පවතී. එය තරුණ පරපුරේ මානසික සහ බුද්ධිමය වර්ධනයට අත්‍යවශ්‍ය මෙවලමක් බවට පත් වී ඇත්තේ ය.

i. මෙහි දැක්වෙන පරිදි යොවුන් සාහිත්‍ය කෘති රචනා වන්නේ කුමන වයස් කාණ්ඩයේ පිරිසක් ඉලක්ක කොට ගෙන ද?
ii. ස්වකීය නිර්මාණකරණයේ දී යොවුන් සාහිත්‍යවේදීන් අනිවාර්යයෙන් අවබෝධය ලබා ගත යුත්තේ කවර කරුණු පිළිබඳ ද?
iii. යොවුන් සාහිත්‍යකරුවන්ට නිර්මාණශීලී ලෙස මැදිහත් විය හැක්කේ කවර දේ වෙනුවෙන් ද ?
iv. යොවුන් සාහිත්‍යයේ ප්‍රභේද දෙකක් නම් කරන්න.
v. යොවුන් දරුවන් වෙත සාහිත්‍ය නිර්මාණ සමීප කළ යුත්තේ කවරාකාරයෙන් ද?

(ලකුණු 2 × 5 = 10)

5.

පහත සඳහන් විස්තරය පදනම් කර ගෙන රාජකාරි ලිපියක් සකස් කරන්න. (වචන 100ක් පමණ ප්‍රමාණවත් ය)

පසුගිය දිනක පරණවත්ත, ප්‍රබෝධාගම "නව ශක්ති" තරුණ සංවිධානයේ වාර්ෂික සභාව රැස්වෙමින් පහත සඳහන් කරුණු සාකච්ඡාවට බඳුන් කෙරිණි.

- දැනට සංවිධානයේ නිෂ්පාදනය කෙරෙන හස්ත කර්මාන්ත නිමැවුම් තවදුරටත් තාක්ෂණික වශයෙන් පුළුල් කළ යුතු බව
- ඒ සඳහා ව්‍යවසායකත්වය පිළිබඳ නව දැනුමෙන් යුක්ත වීම ඉතා වැදගත් බව
- ප්‍රායෝගික පුහුණු අවස්ථා සඳහා යොමු වීමේ ක්ෂේත්‍ර පිළිබඳ අවබෝධය ලබා ගත යුතු බව

- ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩමුළුවක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස නුගේගොඩ, කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ ව්‍යවසායකත්ව උපදේශකවරයකුට ලිපියක් යැවිය යුතුව ඇත.

  ''නව ශක්ති'' තරුණ සංවිධානයේ ලේකම් සුදීප පූර්ණජිත් ඔබ යැයි සිතා එම ලිපිය සකස් කරන්න.

  **නැතහොත්**

  පහත දැක්වෙන තොරතුරු පදනම් කර ගෙන පුවත්පත් වාර්තාවක් සකස් කරන්න. (වචන 100ක් පමණ ප්‍රමාණවත් ය)

  - ඇවරිහේන 'මිණිදැදිරි වැව' කාලාන්තරයක් ප්‍රතිසංස්කරණය නොකෙරුණු බව
  - එයින් අක්කර සිය ගණනක කුඹුරු සඳහා ජලය ලබා දෙන බව
  - ප්‍රදේශයේ ප්‍රජා සංවර්ධන සමිතිය, වැඩිහිටි සමිතිය, පරිසර සංගමය හා ස්වේච්ඡා සංවිධාන සියල්ල ඊට සක්‍රීය ලෙස දායකත්වය සැපයූ බව
  - ''පිවිතුරු පෙදෙසක්'' නම් වැඩසටහන යටතේ වැව සම්පූර්ණයෙන් පිළිසකර කළ බව
  - වැව් ඉස්මත්ත, වැව් බැම්ම, වැව් පතුල හා අවට පරිසරය ම ඒ යටතේ පිරිසිදු කෙරුණු අතර ආකර්ෂණීය පරිසරයක් නිර්මාණය වීම
    මිණිදැදිරිගම ප්‍රාදේශීය වාර්තාකරු පහන් ගුණසේකර ඔබ යැයි සිතන්න.



iruonline.com

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
**Ministry of Education, Higher Education and Vocational Education**

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2024 (2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024 (2025)
General Certificate of Education (Ord.Level) Examination, 2024(2025)

සිංහල භාෂාව හා සාහිත්‍යය III
சிங்களமொழியும் இலக்கியமும் III
Sinhala Language and Literature III

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

වැදගත් : උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.

- **1, 2, 3, 4** ප්‍රශ්නවලටත් **5,6,7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
  මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** i සිට x තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "මම එ බස් අසා රජකු බොළඳ නියා යැ'යි නින්දා කළෙමි'යි කී ය."

**(අ)** මෙය කවරෙකුගේ ප්‍රකාශයක් ද? **(ආ)** මෙය ශ්‍රවණය කළ අයගේ නම ලියන්න.

(ii) "සතොස් කරන වීණා නද ඇසුමට
නොගොස් සිටින පිල්බර ගණ ගොදුරට
වෙසෙස් රුවින් තම මැවුවත් බඹහට
සඳැස් සවන් නොකළැයි වූ නොසතුට

**(අ)** මෙහි නොසතුටට පත් වූවෝ කවරහු ද?
**(ආ)** එසේ නොසතුටට පත් වූයේ කවර හේතුවක් නිසා ද?

(iii) "කුරක්කන් තුනයි වැපුරුවෙ අමාරුවේ
කපන්ටත් බැරුව අතපය රුදාවේ
------------------------------------------------------
------------------------------------------------------

**(අ)** මෙම කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
**(ආ)** කෝල්මුර කවි ගායනා කළේ කුමන අවස්ථාවන්හි දී ද?

(iv) "හොඳයි, කරුණාව වේළිච්ච කුඹුරට වැස්සක් වගෙයි කියනවා නේ!"

**(අ)** මේ ප්‍රකාශය කරනු ලැබුවේ කවරකු විසින් ද? **(ආ)** එය ශ්‍රවණය කළේ කවරෙක් ද?

(v) "පටහැණි වෙන්ටා නොව ඔහු අණටා
වෙන මග ගැලවෙන්ටා
නොපෙනෙන කලටා සැරසෙනු කුමටා
මා දැන් වළකන්ටා

**(අ)** මෙහි 'ඔහු' යනුවෙන් අදහස් කෙරෙන්නේ කවරෙක් ද?
**(ආ)** ඉහත ප්‍රකාශය කළ තැනැත්තා වැළැක්වීමට උත්සාහ කරනු ලබන්නේ කවරකු විසින් ද?

(vi) "තියෙන දෙයක් විකුණලා හරි සල්ලි හොයා ගත්තා කියමුකො"

**(අ)** මේ ප්‍රකාශය කළේ කවරෙක් ද? **(ආ)** ප්‍රකාශය උපුටා ගත් කෘතිය නම් කරන්න.

(vii) පහත දැක්වෙන රජවරුන්ගේ සාහිත්‍ය සේවය සඳහා අනුග්‍රහය දැක්වූ අමාත්‍යවරුන්ගේ නම් ලියන්න.

**(අ)** II පරාක්‍රමබාහු රජු **(ආ)** IV පරාක්‍රමබාහු රජු

(viii) මහගම සේකර විසින් නිර්මාණය කරනු ලැබූ

**(අ)** නාට්‍ය නිර්මාණයක් **(ආ)** නවකතා කෘතියක් නම් කරන්න.

(ix) -----------------------------------------
-----------------------------------------
ඉවසන්නට පුළුවන් නම්
උඹයි මගේ පුතා උතුම්

**(අ)** ඉහත කවියේ මුල් පද දෙක සම්පූර්ණ කරන්න.
**(ආ)** මෙම කාව්‍ය රචකයා ස්වකීය නිර්මාණ ඉදිරිපත් කළ තේමාවක් සඳහන් කරන්න.

(x) "බත් පාත්‍රයක් පිළිගන්වා ගන්ට පාත්‍රය ගෙනව මැනවැ"
**(අ)** මේ ප්‍රකාශය කවුරුන් විසින් කා හට කරන ලද්දක් ද?
**(ආ)** ප්‍රකාශය ඇතුළත් කෘතිය ලියවුණු සාහිත්‍ය යුගය නම් කරන්න.

(ලකුණු 02×10=20යි )

**2.** පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "එ දවස් උග්ගසේන නම් සිටුපුත් **යාළුණු** කෙනෙකුන් හා සමග මැස්සක් මත්තෙහි සිට ආස සිට නටන ඒ විද්දත් දුවගේ හාවභාව ලීලා දැක **වායොධාත්වාධික** රූප කලාප විකාරයක් බලවත් නියා ය යි නො සිතා ඈ කෙරෙහි බලවත් වූ ප්‍රෙම ඇතිව..."

**(අ)** අංකිත පදවල අර්ථ ලියන්න.

**(ආ)** මින් අනතුරු ව උග්ගසේන සිටුපුත්‍රයාගේ හැසිරීම කෙබඳු වී ද?

(ii) "දිමුතු යසස් වන් **කුසුම** **සරාගේ**
**නුමුතු** සුවඳ මල් පැලඳ සරාගේ
දකුතු රඟන සුරඟන රඟ ලාගේ
උමතු නොවෙ ද කෙලෙසක සිත කාගේ"

**(අ)** තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

**(ආ)** මෙහි ඇතුළත් කාව්‍යාලංකාර දෙකක් නම් කරන්න.

(iii) නොදනිති **හසරක්** නුපුරුදු එ තිදෙන
පැමිණෙත **පිරිපත** වළකනු කෙලෙස ද
දිරි ඇති මුත් පුත නරයෙකි ගත මුදු
ලොව දැක නැත අද වන තුරු කිසි කල"

**(අ)** මෙම කොටස හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

**(ආ)** අංකිත පදවල අර්ථ ලියා දක්වන්න.

(iv) "කෙසේ වුව ද මෙය මට ම තනි කර තබා ගැනීමට තරම් **'බර වැඩි'** අත්දැකීමක් විය. පිට යාළුවකුට එය නොකිය හැකි ය. ගෙදරින් වුව ද කිව හැක්කේ මල්ලිට පමණකි. මල්ලී මා සිතූ තරම් විශ්වාසවන්තයෙක් නොවී ය.

**(අ)** මෙහි 'බර වැඩි' අත්දැකීම කුමක් ද?

**(ආ)** මල්ලී සිතූ තරම් විශ්වාසවන්තයෙකු නොවූ බව කථකයා දැන ගත්තේ කෙසේ ද?

(v) "... නඟන ලද **දළ පුවු සේසත්** ඇති එක් සියයක් රාජාසන ආදි වූ පිළියෙල කොට තබන ලද ශ්‍රී විභූතීන් දැක, මහ බෝසතාණන් වහන්සේ විසින් වදාරන ලද ක්‍රමයෙන් ම සියල්ල කොට සේනා මධ්‍යයට වැද බොහෝ දෙන **ක්ෂෝභ කොට** තමන්ගේ මියුලු නුවරට පලා ගියහ. "

**(අ)** තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

**(ආ)** "සියල්ල කොට" යන්නෙන් අදහස් කළේ මොනවා ද?

(ලකුණු 04×05=20යි)

**3.** අමාවතුර කතුවරයා විසින් භාවිත කරන ලද

(අ) සජීවී සංවාද ද

(ආ) කෙටි වැකි ද

කෘතියේ සාර්ථකත්වයට හේතු වී ඇත. 'අඟුල්මල් දමනය' පාඩම ඇසුරෙන් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

තත්කාලීන සමාජයේ,

(අ) ඓතිහාසික තොරතුරු ද

(ආ) සමාජ ආර්ථික තොරතුරු ද

සැලළිහිණි සන්දේශයෙන් කුළු ගැන්වෙයි. 'මග විසිතුරු' පද්‍ය පන්තිය ඇසුරෙන් උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 15යි )

**4.** බැද්දේගම නවකතාවෙන් ,

(අ) පිටිසර ගමක් ක්‍රමයෙන් අභාවයට පත් වීම

(ආ) ඒ හා සමග ම එහි ගම්වැසියන් ද අභාවයට යෑම නිර්මාණාත්මක ලෙස නිරූපණය වෙයි. නිර්දිෂ්ට කොටස ඇසුරෙන් උචිත උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

(අ) සංවේදී මානව බැඳීම් සංයමයෙන් ඉදිරිපත් කිරීමත්

(ආ) ගැඹුරු ජීවන දර්ශනයක් ප්‍රකට වීමත්

හේතුවෙන් **වස්සානය** පද්‍ය පන්තිය රසවත් නිර්මාණයක් වී ඇත.

එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

**5.** 'ගංගාවේ සංගීතය' පද්‍ය පන්තිය ජීවිතයේ විවිධ අවස්ථා හා බැඳුණු යථාර්ථය ඉස්මතු වන අයුරින් නිර්මාණය වී ඇත. උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න.

(ලකුණු 10යි )

**6.** සදාචාර සම්පන්න, සශ්‍රීකත්වයෙන් පිරි සුන්දර ගම් පියසක් පිළිබඳ තොරතුරු 'කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට' පද්‍ය පන්තියෙන් ප්‍රකට වේ.
උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 10යි )

**7.** අනපේක්ෂිත ව මුහුණ දෙන අවස්ථා හමුවේ මිනිස් ජීවිතවල සිදු වන විපර්යාස මැනවින් විවරණය වන නිර්මාණයක් ලෙස දියමන්ති මාලය කෙටිකතාව අගය කළ හැකි ය. උදාහරණ **තුනක්වත්** දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10යි )



iruonline.com